# මහාවිහාරයට පහරදීමට පඬුඅබා යොදාගැනීම

අප ජීවත්වන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ආධිපත්‍යය යටතේ සිංහල සංස්කෘතියට සෑම අතකින් ම පහර වැදෙන යුගයක ය. විජාතිකයෝ ද මෙරට සමහරු ද පිටතින් සිට පහර දෙති. ඔවුන් හඳුනාගැනීම එතරම් අපහසුවක් නැත. මේ අතර තවත් සමහරු ඇතුළතින් සිට පහර දෙති. ඔවුන්ගෙන් ඇතැමෙක් සිංහල බෞද්ධ සංස්කෘතියට පහර දීම සඳහා ඒ හඳුනාගැනීමට සිංහල සාහිත්‍යය හදාරති. තවත් සමහරු බෞද්ධ ධර්මය හදාරති. එසේ හැදෑරීමෙන් එක්කෝ සිංහල සංස්කෘතියෙහි දුර්වල තැන් දැනගැනීමට උත්සාහ කරති. එසේත් නැත්නම් බුද්දහමේ වැරදි සොයාගැනීමේ නිෂ්ඵල ව්‍යායාමයක නිරත වෙති. ඒ වෙනුවෙන් පශ්චාත් උපාධි සඳහා බෞද්ධ දර්ශනය හා බෞද්ධ සංස්කෘතිය හදාරති. ඇතැම්හු කෙලින් ම සිංහල බෞද්ධ සංස්කෘතියට සෘජුව ම පහර දීමට කලා කෘති නිර්මාණය කරති. තවත් අය සිංහල සංස්කෘතියට පක්ෂපාති වන බව පෙන්වමින් ඒ වෙනත් අතකට යැවීමට කලා කෘති නිෂ්පාදනය කරති.

අප කලින් සඳහන්කර ඇති ආකාරයට අපේ වංසකතා ද ලියැවී ඇත්තේ යම්කිසි අරමුණකිනි. විශේෂයෙන් ම මහාවංසයෙන් පසු වංසකතා ලියැවී ඇත්තේ ථෙරවාද බුද්දහම ආරක්ෂාකිරීම සඳහා ය. දීපවංසය එකී වංසකතා සාහිත්‍යයෙහි ආරම්භය විය යුතු ය. ආන්ද්‍ර ප්‍රදේශය ථෙරවාද බුද්දහම නැතිවී යෑමේ තර්ජනයට මුහුණ දීමෙන් පසුව ඒ ඇරඹුණු බව සිතාගත හැකි ය. දීපවංසයෙන් අවුරුදු සියයකට පමණ පසුව ලියැවුණු බව කියන මහාවංසය මේ ආරක්ෂණවාදී පිළිවෙත ඉහළ මට්ටමකට වර්ධනය කර ඇත.

දීපවංසය ලියැවීමෙන් පසු හා විශේෂයෙන් ම මහාවංසයෙන් පසු අපේ සාහිත්‍යය එකම මගක් ගෙන ඇත්නම් ඒ පුදුමයට කරුණක් නො වේ. අද පවා සිංහල බෞද්ධයන්ගේ ප්‍රධාන කාර්යභාරය වී ඇත්තේ ථෙරවාද බුද්දහම රැකගැනීම ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්ව ආධිපත්‍යය යටතේ එයට විරුද්ධ මගක යන්නවුන් හඳුනාගැනීම අපේ සුබසිද්ධිය සඳහා ම වෙයි.

අපේ මුළු ඉතිහාසය ම වංසකතාවල ලියැවී ඇත්තේත් පස්වැනි සියවසෙන් පමණ පසු ඒ විකාසය වී ඇත්තේත් ථෙරවාද බුද්දහම ආරක්ෂාකිරීම ප්‍රධාන තේමාව කරගනිමිනි. අවුරුදු එක්දහස් පන්සීයක් පමණ එකම තේමාවක ඉතිහාසය දැනුවත්ව විකාසය වීමට සැලැස්වීම ම වැදගත් ය. එයට අනුශාසනා කළෝ මග පෙන්වූවෝ මහාවිහාරික භික්ෂූන් වහන්සේ ය. එබැවින් ම ඇතැමුන් මහාවිහාරික භික්ෂූන් වහන්සේට අගතිගාමීව චෝදනා කිරීම පුදුමයක් නො වේ. අද ඒ චෝදනා එකලට ද වඩා බලවත්ව සෘජුව හා වක්‍රව එල්ලවන බව ද අමතක නොකළ යුතු ය.

මහාවිහාරයට පහරදීම යනු ජාතියට පහරදීම බව වඩාත්ම හොඳින් තේරුම් ගන්නට ඇත්තේ බ්‍රිතාන්‍යින් විය යුතු ය. ඔවුහු අපේ ඉතිහාසය හැදෑරීමට වඩාත්ම වෑයමක් දැරූහ. ඇතැම් බ්‍රිතාන්‍ය නිලධාරීන් වෙනත් වුවමනාවක් නැතිව ඉතිහාසය හදාරන්නට ඇති නමුත් සමස්තයක් ලෙස ගත්කල බ්‍රිතාන්‍යයන්ගේ ඉතිහාසය හැදෑරීමේ අවශ්‍යතාව අව්‍යාජ එකක් නො වී ය. ඔවුන්ට අවශ්‍ය වූයේ ගිවිසුමකින් පමණක් තමන්ට හිමිකර ගැනීමට හැකි වූ මේ රටේ ජනතාවගේ අභිමානය කෙසේ හෝ නැතිකිරීම ය. ආර්ථික වශයෙන් රාජකාරි ක්‍රමයේ ස්වාධීනත්වය හා අභිමානය නැතිකර එයට ඊනියා වැඩවසම් ක්‍රමයක් යන හංවඩුව ගසා කුලියට (වැටුපට) වැඩකිරීම හඳුන්වා බටහිර දැනුමේ (සංස්කෘතියේ) ආධිපත්‍යය ද ඇතිකර සිංහලයන්ගේ කොන්ද බාගයක් කැඩීමට බ්‍රිතාන්‍යින් සමත් වූ නමුත් බුද්දහම නැතිකර දැමීමට ඔවුන්ට නොහැකි විය.

භික්ෂූන්වහන්සේට ඇති ගෞරවය හා උන්වහන්සේ හා ගිහියන් අතර තිබූ සම්බන්ධය නැතිකිරීමට බ්‍රිතාන්‍යයෝ හැකි සෑම උත්සාහයක් ම ගත්හ. මහාවිහාරයට පහරදීම ද ඉන් එක් උත්සාහයක් විය. මහනුවර රාජධානියේ රදළවරුන් සිංහලයන්ට ද්‍රෝහි වී සිංහල රජු බ්‍රිතාන්‍යින්ට පාවාදුන් බවට මතයක් ඇතිකළෝ ද ඔවුහු ම ය. එහි දී සිදුවූයේ බ්‍රිතාන්‍යයන් තම නියෝජිතයා වූ ඩොයිලි මගින් ඇතිකළ ගිවිසුම නමැති ගැටයට සිංහල නායකයන් හසුවීම ය. සිංහල නායකයන් එලෙසින් තම ගැටයට හසුකර ගත් බ්‍රිතාන්‍යයෝ සිංහල නායකයන්ට විරුද්ධව සිංහල රජුට ද්‍රෝහි වූ බවට චෝදනාවක් ද එල්ල කළහ.

© Prof. Nalin De Silva

ඒ අයුරින් ම ඔවුන් මහාවිහාරයට විරුද්ධව මතයක් ඇතිකර ඇති බව පෙනෙයි. දහනවවැනි සියවසේ අගභාගයේ පමණ සිට ඇතැම් උගතුන් අතර ඇති මතයක් නම් මහාවිහාරය ඉන්දියානු ගැති වූ බව ය. මේ මතය ඇතැම් භික්ෂූන් වහන්සේ අතර ද පැතිරී ගොස් ඇති බව උන්වහන්සේ ලියා පළ කර ඇති පොතපතින් පැහැදිලි වෙයි. මහාවිහාරික භික්ෂූන් වහන්සේ ස්වදේශිකයන්ට විරුද්ධව දකුණු ඉන්දියාවට ගැති වී ඇති බව ඇතැම් උගතුන් අතින් ප්‍රකාශ වී ඇත. එහෙත් ඒ සඳහා සාක්ෂි කිසිවක් නැතිවීම මේ මතය තහවුරු නොවීමට එක් හේතුවකි. මහාවිහාරය උතුරු ඉන්දියාවට ගැතිවිණි යැයි යමකු කීව ද දකුණු ඉන්දියාවට ගැතිවිණි යැයි කියන්නේ කෙසේ ද?

මහාවිහාරය උතුරු දඹදිවට ගැතිවිණි බවට ඉදිරිපත් කළ හැකි සාක්ෂි වනුයේ ධර්මාශෝක රජු පිළිබඳ කෙරී ඇති වර්ණනාව හා බුදුන් වහන්සේට හා ත්‍රිවිධ චෛත්‍යයට සිංහල බෞද්ධයන්ගේ ඇති ඉමහත් ගෞරවය ය. එහෙත් ඒ එකකින්වත් ගැති බවක් පෙන්නුම් කළ නො හැකි ය. ගෞරවය හා ගැති බව අතර ඇත්තේ විශාල වෙනසකි. සිංහලයෝ කිසි දිනෙක උතුරු දඹදිව කිසිම රාජ්‍යයකට යටත් නො වූහ. එහෙත් සිංහලයන් හා උතුරු දඹදිව අතර විශේෂ සම්බන්ධයක් නම් විය. ඒ අන් කිසිවක් නොව නැගෙනහිර හා ඊසාන දඹදිව එකල තිබූ අර්ධ වෛදික සංස්කෘතිය හා සිංහල සංස්කෘතිය අතර තිබූ සම්බන්ධය ය.

මේ සංස්කෘතික සම්බන්ධය ආර්යයන් දඹදිවට පැමිණීමට පෙර සිට ම තිබී ඇති බව පැහැදිලි ය. අප කරුණු සෙවීමට උත්සාහ ගතහොත් ආර්යයන් පැමිණීමට පෙර මේ සම්බන්ධය මුළු දඹදව පුරා ද, චීනය තෙක් ද වී ඇති බව පැහැදිලි වනු ඇත. අපේ රටේ තිබූ නිල වෙදකම, කටු චිකිත්සාව චීනයට රැගෙන ගිය බවට ද මතයක් ඇත. ඒ කෙසේ වෙතත් ප්‍රාග් වෛදික යුගයේ කලාපයේ, එනම් චීනයේ සිට දෙවුන්දර තුඩුව දක්වා, තිබූ සංස්කෘතික සම්බන්ධකම් ගැන ඉතිහාසඥයන් සොයා නොබැලීම නම් වරදකි.

ආර්යයන් දඹදිවට පැමිණීමෙන් පසුව මේ සම්බන්ධකම් අඩුවන්නට ඇත. දඹදිව මුළුමනින් ම භාරතය බවට පත්වීමට පෙර ලංකාව සහ නැගෙනහිර හා ඊසාන දඹදිව අතර සමීප සම්බන්ධය බුද්ධදහමත් සමග තවත් තහවුරු වී ඇති බව පෙනෙයි. වංසකතාවලින් නිරූපණය වන්නේ මේ සම්බන්ධය ය. ලංකාව හා මගධයේ කොටසක්, වංගය, කාලිංගය හා ආන්ද්‍ර ප්‍රදේශය අතර තිබූ සංස්කෘතික සම්බන්ධය ඉතා දැඩි වූවාට සැකයක් නැත. අශෝක රජුගේ කාලයට ටික කලකට පෙර දඹදිව දකුණු ප්‍රදේශයට බටහිර ආසියාවෙන් හෝ වෙනත් ප්‍රදේශයකින් (උතුරු අප්‍රිකාවෙන්) හෝ ද්‍රවිඩයන් සංක්‍රමණය වී ඇති බව පෙනී යයි. ද්‍රවිඩයන් දකුණු දඹදිව තිබූ සංස්කෘතිය වෙනස් කර එහි ද්‍රවිඩ සංස්කෘතියක් නිර්මාණය කර ඇත. ද්‍රවිඩ යන්නෙහි තේරුම ද දකුණ බව අමතක නොකළ යුතු ය.

ද්‍රවිඩ සංස්කෘතික හා දේශපාලනික රැල්ල උතුරටත් දකුණටත් ප්‍රචලිත වීම නවතා ඇත්තේ ලංකාව හා කාලිංගය (ඔරිස්සාව) වීම වැදගත් ය. ඒ රැල්ල අපට අදාළ දඹදිව නැගෙනහිර පැත්තට වන්නට උතුරින් අවසාන වී ඇත්තේ ආන්ද්‍ර ප්‍රදේශයෙනි. ආන්ද්‍ර ප්‍රදේශයේ භාෂාව වූ තෙළිඟු බස වඩාත්ම ද්‍රවිඩකරණයට ලක්වූ දඹදිව භාෂාව යැයි කියනු ලැබෙයි. (එම බව වඩාත්ම ආර්යකරණයට ලක්වූ ද්‍රවිඩ භාෂාව යැයි කියන්නෝ ද වෙති.) ආන්ද්‍ර ප්‍රදේශය හා ලංකාව ථෙරවාද බුද්ධදහමේ මධ්‍යස්ථාන විය.

ලංකාවේ ඉතිහාසය කලාපයේ ඉතිහාසයෙන් වෙන්කර ඉගෙනගත නො හැකි ය. අවාසනාවකට මෙරට උගතුන් එවැනි අධ්‍යයනයකට යොමු වී නැත. කිහිප දෙනකු එකතු වී එවැනි අධ්‍යයනයක් අරඹන්නේ නම් මැනවි. ආන්ද්‍ර ප්‍රදේහයෙන් බුද්ධදහම නැතිවීම දීපවංසය ලියූ ටික කාලයකට පෙර (හතරවැනි සියවසේ පමණ) ඇරඹෙන්නට ඇතැයි සිතිය හැකි ය. ඉන් පසු ලංකාවේ ථෙරවාදය රැකීම සිංහලයන්ගේ ප්‍රධාන කාර්යභාරයට පත් වී ඇතැයි අපි කලින් සඳහන්කර ඇත්තෙමු. බුද්ධගොස් හිමියන් මෙරටට වැඩම කර ධර්මය පාලි භාෂාවෙන් ලියා ඇත්තේ එසේ ථෙරවාදය ආරක්ෂාකිරීමට ය. ධර්මය පාලියෙන් ලිවීම බුද්ධගොස් හිමියන්ට පෙර ඇරඹි කාර්යයක් බව බුද්ධදත්ත හිමියන් බුද්ධගොස් හිමියන්ට පෙර ලංකාවට වැඩම කිරීමෙන් පැහැදිලි වෙයි. ලංකාවට නැවක වැඩම කළ බුද්ධඝෝෂ හිමියනට ආපසු ආන්ද්‍ර ප්‍රදේශයට වෙනත් නැවක වැඩම කළ බුද්ධදත්ත හිමියන් දක්නට ලැබී ඇත.

© Prof. Nalin De Silva

ද්‍රවිඩ සංස්කෘතියෙහි බලපෑම ලංකාවට දැනෙන්නට වී ඇත්තේත් මෙකළ ය. දකුණු භාරතයෙන් පළමුවරට ලංකාව ආක්‍රමණය කෙරී ඇත්තේ පස්වැනි සියවසේ ය. ලංකා ඉතිහාසයේ තීරණාත්මක සියවස් හතරවැනි පස්වැනි සියවස් යැයි සිතිය හැකි ය. අපේ ඉන්පසු ඉතිහාසය පමණක් නොව ඉන් පෙර ද ඉතිහාසය තීරණය වී ඇත්තේ මෙකල ය. වංසකතා ලියැවී ඇත්තේ ථෙරවාදය රැකගැනීමට ය. එහි දී ඒ රැකගතයුත්තේත් ඒ සඳහා ලංකාව ස්වාධීන රාජ්‍යයක් ලෙස ආරක්‍ෂාකරගත යුත්තේත් ද්‍රවිඩයන්ගෙන් ය යන මතයට මහාවිහාරික භික්‍ෂූන් වහන්සේ එළඹ ඇති බව පැහැදිලි ය. තුට්ටු දෙකේ කසිකබල් දේශපාලනඥයන්ට නොතේරුණ ද මහාවංසයෙහි එළාර දෙමළ වන්නේ පස්වැනි සියවසට පසු ඉතිහාසය මෙන් ම එයට පෙර ඉතිහාසය ද ඒ යුගයේ දී ජනප්‍රවාද ඇසුරෙන් මහාවිහාරයේ දී සකස් වූ බැවිනි. එවැනි භික්‍ෂූන් වහන්සේ ස්වදේශිකයන්ට විරුද්ධව දකුණු දඹදිවට ගැතිකම් කෙළේ යැයි පැවසීම බ්‍රිතානීන් ජනතාව මහාවිහාරයට විරුද්ධව පෙළඹවීමට කරන ලද අසාර්ථක උත්සාහයක් සේ පෙනී යයි.

ලංකාවට ආසන්නයේ ම පිහිටියේ ද්‍රවිඩ (දකුණු) භාරතය වුව ද අපට සංස්කෘතික වශයෙන් තවමත් සමීප උතුරු භාරතය ය. පසු කලෙක කේරළයෙන් පැමිණි අය හා කේරළයට ගිය අය හේතුවෙන් පොල් ගස වටා ගෙතුණු සංස්කෘතික සම්බන්ධයක් ලංකාව හා කේරළය අතර තිබීම මෙහි ව්‍යතිරේඛයක් පමණකි. අප දඹදිව හා සංස්කෘතික වශයෙන් සම්බන්ධ වන්නේ පූර්ව ද්‍රවිඩ යුගයේ අර්ධ වෛදිකයන් හා පූර්ව වෛදිකයන් ඔස්සේ ය. දකුණු දඹදිව පාණ්ඩ්‍ය දේශය, ද්‍රවිඩ දේශයක් වීමට පෙර අර්ධ වෛදික ප්‍රදේශයක් විය. විජය කුමරුට බිසවක ගෙනාවේ යැයි කියන කාලයේ පාණ්ඩ්‍ය දේශය ද්‍රවිඩ නො වීය. සිංහවාංශික පණ්ඩුවාසදෙව් කුමරු හා පාණ්ඩ්‍ය දේශය අතර ඇත්තේ සම්බන්ධයකි. පඬුඅබාට ද මේ සම්බන්ධකම් ඇත. පඬුඅබා සිංහයන් ඝාතනය (ලානය) කර ස්වදේශිකයන්ට බලය ලබාදුන් වීරයකු කිරීම පිටුපස එදත් අදත් ඇත්තේ මහාවිහාරයට පහර දීමේ අවශ්‍යතාව ය. කලාපීය සම්බන්ධකම් නොදැක, (ථෙරවාද) බුද්ධදහම යනු අපේ කලාපයේ චින්තනයෙන් බිහි වූ ආගම බව නොදැන, ඒ ආරක්‍ෂාකිරීමට ධර්මය පාලියෙන් ලිවීම ගැන වැරදි අවබෝධයෙන් යුක්තව එදා මහාවිහාරය විවේචනය කරන්නටත් පඬුඅබාගේ පියා පිළිබඳ වෙනත් කතන්දර (ප්‍රවාද) කීමටත් ඇතැම් උගතුන් පෙළඹෙන්නට ඇත. එහෙත් අද පඬුඅබාගේ උත්පත්තිය ගැන කතන්දර හදන්නේ අවසානයේ දී මහාවිහාරයට පහර දීමට බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට ඇති අවශ්‍යතාව වෙනුවෙනි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva